# නිෂ්පාදන කර්මාන්ත

## යකඩ හා වානේ කර්මාන්තය

- ඉතා පැරණි කර්මාන්තයක් වන මෙය කාර්මික විප්ලවයත් සමග සීඝ්‍ර දියුණුවක් ඇතිවිය
- රටක කාර්මික ශක්තිය තීරණය කරන සාධකයක් වීම හා උපකරණ නිපදවීමට අවශ්‍ය අමුද්‍රව්‍යක් ලෙස යොදා ගැනීම නිසා වැදගත් ස්ථානයක් හිමි වන කර්මාන්තයකි
-

| නිෂ්පාදන රටවල් (ව්‍යාප්ති ප්‍රදේශ) | අපනයන රටවල් | ආනයන රටවල් |
|---|---|---|
| චීනය | චීනය | ඇ.එ.ජ |
| ජපානය | ජපානය | යුරෝපා රටවල් |
| මහා බ්‍රිතාන්‍ය ඇතුළු බටහිර යුරෝපය | යුරෝපා රටවල් | ද.කොරියාව |
| රුසියාව | ද.කොරියාව | තායිලන්තය |
| ඇ.එ.ජ | රුසියාව | චීනය |
| බ්‍රසීලය | | |
| ඉන්දියාව | | |

- **නව ප්‍රවණතා හා ලක්ෂණ**
  - වෙනත් ලෝහවලට මිශ්‍ර කිරීමෙන් ගුණාත්මක භාවය වැඩිකරගත හැකිය
  - භාවිතයෙන් ඉවත්කළ පසුව ප්‍රතිචක්‍රීකරණය කල හැකි වීම
  - නිෂ්පාදන කටයුතු නවීකරණය වීම
  - ගල් අඟුරු වෙනුවට විකල්ප බලශක්ති භාවිතා කිරීම
  - ප්‍රාග්ධනය ,වෙළඳපොළ මත ස්ථානගත වීමේ නැඹුරුවක් පැවතීම
  - නැගෙනහිර ආසියා රටවල නව වෙළඳපොළක් බිහි වීම



ක්‍රියාකාරකම

1. යකඩ හා වානේ භාවිතයට ගන්නා විවිධ අවස්ථා ඇතුලත් ලේඛනයක් සකස් කරන්න
2. ලෝකයේ යකඩ හා වානේ ඉල්ලුම දිනෙන් දින වැඩිවෙමින් පවතී.නිදසුන් 2ක් ඇසුරින් පැහැදිලි කරන්න
3. යකඩ හා වානේ නිෂ්පාදිත රටවල් ලෝක ආකෘති සිතියමක ලකුණු කොට නම් කරන්න



